# ලියාපදිංචි වී විදේශ රැකියාවන්හි නිරත දෙමාපියන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය - 2015

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියා සඳහා ගොස් සිටින දෙමාපියන්ගේ දූ දරුවන්ට 2015 වසරේදී ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය , ශිෂ්‍යාවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## සුදුසුකම්

### අ) 5 වසර ශිෂ්‍යත්ව

1 මව හෝ පියා **2009.08.21** හා **2014.08.21** අතර කාලය තුල කාර්යාංශයේ **ලියාපදවිංය ලබාගෙන තිබීම**

2 **2014** වර්ෂයේ **5** වසර ශිෂ්‍යත්වය දිස්ත්‍රික් කඩයිම් ලකුණු ලබා සමත්ව දැනට රජයේ පාසලක අධ්‍යාපනය ලබන අයෙකු වීම.

### ආ) අ.පො.ස.(සා/පෙ.) ශිෂ්‍යත්ව

1. මව හෝ පියා **2008.12.01** හා **2013.12.01** අතර කාලය තුල කාර්යාංශයේ **ලියාපදිංචිය ලබාගෙන තිබීම**

2. **2013** වසරේ අ.පො.ස (සා/පෙ.) විභාගය **ගණිතය, මාධ්‍ය භාෂාව (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි ) හා ආගම විෂයයන්ට** සම්මාන සහිතව අ. පො. ස. (උසස් පෙළ) හැදෑරීමට ප්‍රමාණවත් පරිදි එකවර සමත් වී රජයේ පාසලක උසස් පෙළ හදාරමින් සිටීම.

### ඇ) උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව.

1 මව හෝ පියා **2008.08.01** හා **2013.08.01** අතර කාලය තුල කාර්යාංශයේ **ලියාපදිංචිය ලබාගෙන තිබීම**

2 **2013** වසරේ අ. පො. ස. උසස් පෙළ සමත්වී **රජයේ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන අභ්‍යන්තර උපාධි පාඨමාලාවක්** හදාරනු ලබන පළමු වසර සිසු/ සිසුවියක වීම.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් අදාළ අයදුම්පත සම්පූර්ණ කොට මතු සඳහන් ලියකියවිලිද සමග **ලියාපදිංචි තැපෑලෙන් 2015.03.31 දිනට පෙර** පහත ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් එවන විට ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර,**"ශිෂ්‍යත්ව ප්‍රදානය 5වසර/සා.පෙළ/උසස් අධ්‍යාපන – 2015"** යනුවෙන් සඳහන් කල යුතුය. (මෙහි තමාට අදාළ ශිෂ්‍යත්වය පමණක් සඳහන් කළ යුතුය)

1. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ උප්පැන්න සහතිකයේ පිටපත (විදුහල්පති හෝ ලේඛකාධිකාරී නිල මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය)
2. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ ප්‍රතිඵල ලේඛණයේ පිටපත (විදුහල්පති හෝ ලේඛකාධිකාරී නිල මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය)
3. මව/පියා ගේ නව සහ පැරණි විදේශ ගමන් බලපත්‍රවල ඡායාරූපය සහිත පිටුවේ පිටපත.
4. ශිෂ්‍යත්ව අයදුම්කරුගේ හෝ විදේශ ගත අයගේ (මව/පියා) නම් වල වෙනසක් ඇත්නම් ඒ පිළිබඳ **දිවුරුම් කොමසාරිස්වරයෙක්** මගින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශය.
5. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ ජාතික හැඳුනුම්පතේ හෝ තැපැල් හැඳුනුම්පතේ පිටපත අ.පො.ස. (සා.පෙ.) හා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අයදුම්කරුවන් සඳහා අනිවාර්යය.
6. අ.පො.ස (සා.පෙ). ශිෂ්‍යත්ව අයදුම්කරුවෙකු තමන් දැනට රජයේ පාසලක උසස් පෙළ හදාරමින් සිටින අයෙකු බවට විදුහල්පති විසින් සහතික කරන ලද ලිපිය ( නිල මුද්‍රාව තබා සහතික කළ මුල් පිටපත අනිවාර්ය වේ)
7. විශ්ව විද්‍යාලය මගින් නිකුත් කරන ලද ශිෂ්‍ය හැඳුනුම්පතේ පිටපත.
8. විශ්ව විද්‍යාලයේ හදාරනු ලබන පාඨමාලාව පිළිබඳවත් , එහි කාලසීමාව සහ ප්‍රථම වසරේ අධ්‍යාපනය ලබන අයෙකු බවට ලේඛකාධිකාරී විසින් සහතික කරන ලද ලිපිය (මුල් පිටපත අනිවාර්ය වේ) **(ලියාපදිංචි වූ පසු ඉදිරිපත් කරන්න)**

## ඉතා වැදගත්

- **අයදුම්පතෙහි 3 කොටස විදුහල්පති/ලේඛකාධිකාරී විසින් සම්පූර්ණ කර නිල මුද්‍රාව තබා සහතික කළ යුතුය.**
- **එකම කාණ්ඩයේ ශිෂ්‍යත්වයක් සඳහා අයදුම්කල හැක්කේ එක් වරක් පමණි.**
- **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2015.03.31 වේ.**

**ඉහත කොන්දේසි සපුරා නොමැති හෝ නියමිත ලියකියවිලි සමග ඉදිරිපත් කරනු නොලබන හෝ අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කුමන හේතුවක් මත හෝ සලකා බලනු නොලැබේ.**

අයදුම්පත් යොමුව.:- **කළමණාකරු (සුභසාධන),**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක. 234, සෙන්පති ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

දුරකථන අංකය:- **011-2864117**
**www.slbfe.lk** යන කාර්යාංශ වෙබ් අඩවියෙන්ද තොරතුරු ලබා ගත හැක

සභාපති
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය